හබරාදුව ප්‍රාදේශීය සභාව

ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 13දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට හබරාදුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 03 ක් වෙනුවෙන් ලැබිය යුතු මූලධන ආධාර රු.1,461,771 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.1,461,771 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 06 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.2,959,356 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් ලෙස දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් හා ණයහිමියන් රු.2,959,356 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාලව ලැබී තිබූ උසාවි දඩ රු.163,630 ක් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම් රු.163,630 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ රු.645,966 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.645,966 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයන්හි මුද්දර ගාස්තු ලැබීම් රු.1,000,000 ක් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීමෙන්, වර්ෂයේ ආදායම රු.1,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේ පොලිය වශයෙන් ගෙවන ලද රු.50,510 ක් දේශීය ණය සහ සංවර්ධන ණය ගිණුමට හර කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.50,510 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලිය රු.838,947 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.338,948 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම රු.499,999 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් රු.500,000 කින් හා ස්ථාවර තැන්පතු ශේෂය රු.500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති ගබඩා ද්‍රව්‍ය තොගය රු.1,222,023 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,126,516 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම වත්කම් රු.95,507 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.6,101,400 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබූ රු.415,050 ක් වූ යන්ත්‍රෝපකරණ හා රු.263,900 ක් වූ ලී බඩු හා සවිකිරීම් ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි

(ඕ) ඉකුත් වර්ෂයට අදාල මීපේ පුවක්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ලැබී තිබූ රු.192,646 ක් සමාලෝචිත වර්ෂයේ විවිධ තැන්පතු ලෙස දක්වා තිබීමෙන් තැන්පතු ගිණුමේ ශේෂය හා ණයගැතියන් රු.192,646 ක් වැඩියෙන් දක්වා තිබුණි.

**1.3.4 නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 06 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.5,963,846 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.5 අවිනිශ්චිත ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,090 ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.142,650,503 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි / ණයගැති ලේඛන, ශේෂ සනාථ සහතික, විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.56,181,896 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,475,818 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

**2.2.1 වරිපනම් බදු හා අක්කර බදු**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව අයකර ගත යුතුව තිබූ රු.5,564,098 ක් වූ වරිපනම් බදු හා රු.10,300 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු හා බදුකුලී**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.127,400 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු හා රු.212,905 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.72,720,970 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.2.4 ඉඩම් හා ගොඩනැගිලි බදු**

(අ) හබරාදුව පිහිටි ප්‍රජා වෙළඳ මධ්‍යස්ථාන ඉඩම හා ගොඩනැගිල්ල බදු ගැනිම සඳහා ලක් ස.තො.ස. විසින් 2010 නොවැම්බර් මස 19 දින සිට 2013 නොවැම්බර් 18 දින දක්වා මාසික බදු කුලිය රු.35,000 කට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද, බදු කාලය දීර්ඝ කර ගැනීමට විගණන දිනය වූ 2014 සැප්තැම්බර් 05 දින වනවිටද කටයුතු කර නොතිබුණි. ගිවිසුමෙ 24 වන කොන්දේසිය අනුව බදු ගිවිසුම අවසන් වීමෙන් හෝ අවසන් කිරීමෙන් පසු බදු ගැණුම්කරු, බදු දේපලේ රැඳී සිටි සෑම දිනයක් උදෙසා රු.2,000 ක අලාභයක් බදු දීමනාකරුට ලබාදීමට එකඟ වන බව සඳහන් වී තිබුණි. බදු ගිවිසුමෙ කාලය 2013 නොවැම්බර් 18 දිනෙන් අවසන් වී තිබුණ ද, ගිවිසුම් අත්සන් නොකර රැඳී සිටි කාලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් අයකල යුතු රු.86,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අහංගම පිහිටි ප්‍රජා වෙළඳ මධ්‍යස්ථාන ඉඩම හා ගොඩනැගිල්ල බදුගැනීම සඳහා ලක් ස.තො.ස. විසින් 2009 ඔක්තෝබර් 10 වැනි දින සිට 2012 ඔක්තෝබර් 09 දින දක්වා මාසික බදු කුලිය රු.40,000 කට අවුරුදු 03 ක කාලසීමාවක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම් කාලය අවසන් වී තිබුණ ද, බදු කාලය දීර්ඝ කර ගැනීමට 2014 සැප්තැම්බර් මාසය දක්වාත් කටයුතු කර නොතිබුණි.

ගිවිසුමේ 25 වන කොන්දේසිය අනුව බදු ගිවිසුම අවසන් වීමෙන් හෝ අවසන් කිරීමෙන් පසු බදු ගැණුම්කරු බදු දේපලේ රැඳී සිටින සෑම දිනයක් උදෙසා රු.2,000 ක අලාභයක් බදු දීමනාකරුට ලබාදීමට ලක් ස.තො.ස. එකඟ වන බව සඳහන් වී තිබුණි. ඒ අනුව ගිවිසුම අවසන් වී රැඳී සිටි කාලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය කලයුතු අලාභ රු.894,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 කඩ කාමර බදු

----------------

සභාව සතු කඩ කාමර බදුදීම පිළිබඳව 2014 අගෝස්තු 26 දින කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගිවිසුමේ 02 වන කොන්දේසිය පරිදි බදු ගිවිසුම අවුරුදු 03 ක කාලයට බල පැවැත්වෙන අතර, ඉන් අනතුරුව නැවත මෙම බද්ද අලුත් කරමින් බදුකරු ප්‍රාදේශීය සභාව සමග ගිවිසුමකට එළඹිය යුතුව තිබුණි. නමුත් හබරාදුව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 11 ක් ද, කොග්ගල නිදහස් වෙරළ උද්‍යානයේ කඩ කාමර 02 ක් සහ අහංගම වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ii) ගිවිසුමේ 03 වන කොන්දේසිය පරිදි මොනම හේතුවක් නිසාවත් බදුකරු පූර්ව අනුමැතියක් නොමැතිව බද්ද වෙනත් කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු දීම හෝ නොකල යුතු අතර, එසේ කලහොත් බදු අයිතිය අහෝසි වන බව සඳහන් කර තිබුණි. නමුත් හබරාදුව වෙළඳ සංකීර්ණයේ අංක 16 කඩ කාමරය අතුරු බදු දී තිබුණ ද, ගිවිසුමේ කොන්දේසි අනුව ක්‍රියාකර නොතිබුණි.

(iii) බදු ගිවිසුමේ 04 වන කොන්දේසිය පරිදි බදුකරු මොනම හේතුවක් නිසා වත් සභාවේ පූර්ව අනුමැතියක් නොමැතිව බද්දට ගෙන ඇති කඩ කාමරයක සැලැස්මේ කිසිම ව්‍යුහමය වෙනසක් නොකළ යුතු වුවද හබරාදුව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ පිහිටි ප්‍රදර්ශන කුටිය ඉදිරිපස වූ කොටසක වෙනස් කිරීම් සිදු කර තිබුණි.

(iv) බදු ගිවිසුමේ 07 වන කොන්දේසිය පරිදි බදුගෙන ඇති කඩ කාමරය හැර ඉන් පිටත වෙළඳ ද්‍රව්‍ය තැබීම සහ ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු වුවද හබරාදුව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර ඉදිරිපිට භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබුණි.

(v) ගිවිසුමේ 12 වන කොන්දේසිය පරිදි මාස 03 කට වඩා වැඩි කාලයක් බදු කුලී නොගෙවා සිටියහොත් බදු ගිවිසුම අහෝසි වන බවත්, ඒ පිළිබඳ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන ඊට අමතරව ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට නොහැකි වන සේ කඩ කාමරය වසා මුද්‍රා තැබීමට ප්‍රාදේශීය සභාවට බලය ඇතත්, කඩ කාමර 11 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(vi) ගිවිසුමේ 16 වන කොන්දේසිය පරිදි ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි එකක් හෝ කිහිපයක් බදුකරු විසින් කඩ කරනු ලැබුවහොත් එක් ලිත් මාසයක් දැනුම් දීමෙන් අනතුරුව බද්ද

අවලංගු කර, බදුකරු එම කඩයෙන් ඉවත් කිරීමට සභාවට අයිතිය තිබුණ ද ගිවිසුමේ කොන්දේසි කඩ කල බදුකරුවන් කිසිවකු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(vii) හබරාදුව පැරණි පොදු වෙළඳපොල කඩ කාමර 07 ක් සඳහා රු.500 බැගින් මාසික බදු කුලී අය කලද, කඩ කාමර 06 ක් සඳහා ගිවිසුම් අත්සන් කර, ලිපිගොනු විවෘත කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධිවිධාන අනුව සභාවේ සියළුම මන්ත්‍රීවරුන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබාදිය යුතු වුවත්, 2011 වර්ෂයේ දී සභාපති, උප සභාපති හා මන්ත්‍රීවරුන් 11 දෙනෙකු විසින් ද, 2012 වර්ෂයේ දී උප සභාපති හා මන්ත්‍රීවරු 11 දෙනෙකු විසින් ද, 2013 වර්ෂයේ දී උප සභාපති හා මන්ත්‍රීවරු 07 දෙනෙකු විසින් ද වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

(ආ) වර්ෂ 06 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ රු.6,216 ක් වූ අගරු චෙක්පත් විගණන දිනය වූ 2014 සැප්තැම්බර් 05 දින වනවිටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී නිලධාරීන් හා සේවකයන් වෙත සභා අරමුදලින් රු.141,950 ක අත්තිකාරම් ලබා දී තිබූ නමුත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(ආ) විධිවිධාන පරිදි අත්තිකාරම් ලබා දී තිබූ කාර්යය නිම වූ විගස පියවීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම තත්කාර්ය අත්තිකාරම් මාණ්ඩලික නිලධාරීන්ට පමණක් ලබා දියයුතු බව දක්වා තිබුණ ද රියදුරන් වෙත අවස්ථා 02 කදී රු.13,000 ක අත්තිකාරම් ලබා දී තිබුණි.

**(ඈ)** සභාවෙන් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් 2012 හා 2013 වර්ෂවල අය කරගෙන තිබූ රු.1,094,573 ක එකතු කළ අගය මත බදු, රු.217,943 ක ජාතිය ගොඩනැගීමේ බදු සහ රු.150,025 ක මුද්දර බදු විගණන දිනය වූ 2014 සැප්තැම්බර් 05 දින තෙක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) ජෝවි ළමා උද්‍යානය ඉදිකිරිම සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

(i) උද්‍යානයේ ඉදිකිරීම් රාජ්‍ය නොවන සංවිධානයක් විසින් සිදු කර තිබුණ ද, සභාව හා එකී ආයතනය හා අවබෝධතා ගිවිසුමකට ඇතුලත් වී නොතිබුණි.

(ii) ළමා උද්‍යානය 2012 මාර්තු 19 දින විවෘත කර තිබුණු අතර, 2013 ජුලි 03 දින තෙක් උද්‍යානයේ පරිපාලන කටයුතු සහ ආදායම් එකතු කිරීම රාජ්‍ය නොවන ආයතනයක් විසින් සිදු කර තිබුණි. මේ අනුව 2012 මාර්තු 19 සිට 2013 ජුලි 03 කාලපරිච්ඡේදය තුල සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

(iii) මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 නිශ්ක්‍රීය වත්කම්**

**-------------------**

2012 පෙබරවාරි 27 දින ප්‍රධාන කාර්යාලය සහ අහංගම උප කාර්යාලය සඳහා සභා අරමුදලින් රු.78,500 ක් වැයකර මිලදී ගෙන තිබූ වේලා සටහන් කිරීමේ යන්ත්‍ර දෙකක් විගණන දිනය වූ 2014 සැප්තැම්බර් 05 දින වනවිට නිශ්ක්‍රීයව පැවතුණි.

**4. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය